# පියාසර යාළුකම



සෙනුත් නවිතු කුලප්පුආරච්චි

# පියාසර යාළුකම

සෙනුත් නවිතු කුලප්පුආරච්චි

කතෘ

ධර්මරාජ විද්‍යාලය - මහනුවර
6 ශ්‍රේණිය B
2026

පළමු දිගහැරුම
ප්‍රකාශිත දිනය 2026-05-10

ISBN 978-624-211-485-9

# පිදුම

මහනුවර මහාමායා බාලිකා විදුහලේ විදුහල්පතිතුමිය වන ශශිකලා සේනාධීර මියටත්, ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක, සෙනෙවිරත්න මහලේකම් සර්ටත්, මේ සඳහා මා උනන්දු කල මෙම ව්‍යාපෘතියේ සංවිධාන මණ්ඩලයේ ආදිශිෂ්‍යාවක් ලෙස සිටින මාගේ මව තනුජා රත්නායකටත්, මහනුවර ධර්මරාජ විද්‍යාලයේ විදුහල්පතිතුමා, මධ්‍යම අංශයේ විදුහල්පතිතුමා 6-B පංතියේ පංතිභාර ගුරුතුමියටත්, අංශභාර ගුරුතුමියටත්, මෙම අවස්ථාව ලබා දීමට කටයුතු කිරීම හා මගපෙන්වීම වෙනුවෙන් ගෞරවනීය ස්තුතිය.

මා ඉගනගත් ධර්මරාජ විද්‍යාලයේ අකුරු කියාදුන් සියලුම ගුරුවරුන්ට, යහළුවන්ට හා සියළුම දෙනාට මේ කුඩා උත්සාහය ආදරයෙන් පිදේ..



# පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සුදානම් කරණ බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් සිදුකරණ හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම්කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි. මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වූ හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මූලික අරමුණයි. මේ සදහා නිර්මානකරණයෙන් දායක වූ පාසල් දරුවන් මගපෙන්වූ ගුරුහවතුන් ඇතුලු සැමට ස්තූතිය පුදකරමු.

ශශිකලා සේනාධීර,

විදුහල්පතිනිය,

මහාමායා බාලිකා විද්‍යාලය.

# සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමාය බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

සරත් බී.එස්. අභයකෝන්,
ආණ්ඩුකාරවර,මධ්‍යම පළාත.
සම්මානිත මහාචාර්ය , පේරාදෙණිය විශ්වවිද්‍යාලය.
2026-05-10

# සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමඟින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමී.

ප්‍රදීප් නිලංග දැල,
දියවඩන නිලමේ,
ශ්‍රී දළදා මාලිගාව.



එක ප්‍රදේශයක ලස්සන වනාන්තරයක් තිබුනා. ඒ වනාන්තරයේ ලස්සන ලස්සන මල් පිපී තිබුනා. ඒ වනයේ නපුරු සත්තු සිටි නිසා කවුරුත් ඇතුලට ගියේ නැහැ.

මෙම වනය මැද විශාල පොකුණක් තිබුනා.

එම පොකුණෙත් ලස්සන මල් පිපී තිබුනා. මෙහි ජීවත් උනා ගෙබි පවුලක්. එම පවුලේ ගෙබි පුතා හරිම දඟයි. හරිම ආඩම්බරයි. එයාට කවුරුත් යාළුවෝ හිටියේ නැහැ. කියන දේ අහනවා අඩුයි.

මෙම කැලයේ සමනල් පවුලක් හිටියා. ඒ පවුලේ පුංචි සමනල් දුව හරිම ලස්සනයි. එයාට යාළුවො ගොඩයි. එයාගේ හොඳම කුරුලු යාළුවා එක්ක තමයි එයා සෙල්ලම් කලේ.



කුරුලු යාළුවා උදේට සිංදු කියනවා. සමනලයා මලින් මලට පියඹා ගිහින් පැණි බිබී බඩ පුරවා ගත්තා.

දවසක් සමනලයා යෝජනාවක් ගෙනාවා. "යහළුවේ අපි මේ අහස මුදුනට පියාඹමු ද?....."

"මම නම් අම්මත් එක්ක දවස් කීපයක් ගියා. අපි දෙන්නත් යමු...... මම අම්මාගෙන් අහලා කියන්නම්." කුරුළු යාළුවා කීවා.

අහස මුදුනට පියාඹන්න දෙන්නම අම්මාගෙන් අවසර අරන් පහුවදා උදේම නැගිට්ටා. එදා වැහි දවසක්. දෙන්නම ගමන ගියේ නැහැ. ගහේ අත්තකට වෙලා වහිනවා බලාන හිටියා.



“කුරුළු යාළුවේ අර බලන්න අර ලොකු පොකුණේ ගෙබි පැටියෙක් නෙළුම් කොලේ උඩ ඉන්නවා. එයාව හොඳටම තෙමෙනවා.” සමනලයා කීවා.

“ඒකතමයි මමත් බැලුවේ එයාට තෙමුනට ගානක්වත් නෑ. මම එයාට අඩගහන්න ද මේ ගහ යටට.” සමනලයා කීවා.

“එයා එයිද දන්නේ නැහැ. අපි කතා කරලා බලමු. එයා හරී ආඩම්බරයි කියලා මට අනිත් අය කියනවා ඇහිලා තියනවා.” කුරුල්ලා කීවා.

“කමක් නෑ අපි කතා කරලා බලමු. නැත්නම් තෙමිලා තෙමිලා හෙම්බිරිස්සාව හැදෙයි.....” සමනලයා කීවා.

“එහෙනම් කතා කරන්න. හැබැයි මම නම් එයා එක්ක යාළුවෙන්න කැමති නෑ.....” කුරුළු යාළුවා කීවා.

“ ගෙබි යාළුවේ ඔයා තෙමෙනවා නේද? එන්න මේ ගහ යටට. ඔයා තෙමිලා අසනීප වෙයි......” සමනලයා කීවා.

ගෙබි පැටියා ගස්සලා අහක බලා ගත්තා. ඊටපස්සෙ එයාට හිතුනා සමනලයාව මෙතනට අඬගහ ගත්තානම් බඩ පිරෙන්න කෑම කන්න තිබුනා කියලා. නැවතත් බොරුවට හිනාවුන ගෙබි පැටියා සමනලයාට මෙහෙම කීවා.

“මෙතන නෙළුම් කොලය උඩ තෙමෙන් නෑ. ඔයාලත් මෙතනට එන්න කියලා.....”

“අපට මෙතන තෙමෙන් නෑ. ඔයාට ස්තූතියි යාළුවේ......” සමනලයා කීවා.

ගෙම්බාගේ උත්සාහය හරි ගියේ නැහැ.



එදා වැස්ස හොඳටම තදින් තිබුනා. සමනලයා නොතෙමී ඉන්න මල්පෙත්ත යටට ගියා. කුරුල්ලා ගහේ කොළයක් යට ඉන්නවා. ඒ වැස්සට සමනලයාගේ පියාපත් තෙමිලා තිබුනා. තෙත නිසා පියාපත් බරයි. පියාසර කරන්නත් බරුව සිටියා. පසුවදා වැස්ස පෑයුවත් සමනලයාගේ පියාපත් වේලිලා තිබුනේ නෑ. කුරුල්ලා සමනලයා ලගට ඇවිත් "යාළුවේ ඔයාගේ අත්තටු තෙමිලා නේද? මම ඔයාව අර අතන තියන ගල්තලාව උඩ තියනනද?....." කියා ඇහුවා.

"ඔයාට පුළුවන්ද මට උදව් කරන්න......" සමනලයා ඇහුවා."ඔව් මට පුළුවන්......" කුරුල්ලා කීවා.

එයා සමනලයව අරන් ගිහින් අව්ව තියන ගල්තලාවක් උඩ තිබ්බා. ටික වේලාවකින් අත්තටු වේලුනා. සමනලයාට හරිම සතුටුයි.



පහුවදාත් හොඳින් ඉර පායා තිබුනා. සමනලයයි කුරුල්ලයි අහස මුදුනටම පියාඹුවා. එදා අහස උඩ වටපිටාව ලස්සනට පෙනුනා.

"කුරුළු යාළුවේ මම මෙච්චර දුර කවදාවත් පියාඹලා නෑ. අර ඈත පේන පාට පාට ගස් කොටන් මොනවද?....." සමනලයා ඇහුවා.

"ඒ ගෙවල්. ඒවා ඇතුලේ මිනිස්සු ජීවත් වෙනවා. අපි තව ලොකු උනාම එහෙ බලන්න එක්ක යන්නම් කියලා අම්මා කීවා." කුරුළු යාළුවා කීවා.

අහස මුදුනේ අවුව ටිකක් සැර උනා. දෙන්නම පහලට එන්න පිටත් උනා.



සමනලයාට හරිම මහන්සී. ටික දුරක් පහළට එනකොට සමනලයාට කලන්තයක් ආවා. සමනලයාව පොකුණේ නෙළුම් කොලයක් උඩට වැටුනා.

මේ වැටුන සද්දෙට නිදි කිර කිර පැත්තකට වෙලා හිටපු ගෙම්බා උඩ ගියා. “ කවුද මගේ නින්ද කැඩුවේ.....” ගෙම්බා හයියෙන් කෑගැහුවා. සමනලයා කතාවක් නෑ හරිම මහන්සියෙන් ගෙම්බා දිහා බැලුවා.

“ෂා..... අදනම් බඩ පිරෙන්න කෑමක් ලැබෙන්නයි යන්නේ.....” ගෙම්බාට හිතුනා...

ඒ වෙලාවෙම කුරුල්ලා සමනලයා ලගට ආවා “යාළුවේ නැගිටින්න. ඔයාට මොකද උනේ......” කුරුල්ලා ඇහුවා.

“මම හොඳින්. ඒත් මගේ අත් දෙක රිදෙනවා. මම නැගිටින්නම්.” සමනලයා කීවා.

ගෙම්බා ටික ටික සමනලයා ළඟට ආවා. සමනලයා අමාරුවෙන් පියාඹුවා.

ඒ වෙලාවෙම ගෙම්බා සමනලයව කන්න එයාගේ දිව “ඈවැක්” කියලා ඈතට දික්කරා.



වේගයෙන් එතනට ආපු කුරුල්ලා ගෙම්බාගේ දිවට එයාගේ හොටෙන් කොටාගන කොටාගන ගියා.

ගෙම්බා බයවුනා. තුවාලත් උනා.



ගෙම්බා
"ජබොස්" ගාලා
වතුරට පැනලා
හැංගුනා.

එයාගේ දිව
හෙළෙටම
තුවාල වෙලා
එයා අඬ අඬා
තමයි ගියේ.

සමනලයා
අමාරුවෙන්
අසල තිබුන මලකට පියාඹුවා.

සමනලයාට නිතරම උදව් කරන කුරුළු මිතුරා ගැන හරිම සතුටුයි.

සමනලයාගේ අම්මා කුරුළු යාළුවාට ගොඩක් ස්තුති කලා. එයා හොඳ යාළුවෙක් කියලා කුරුළු මිතුරාව අගය කලා.



දුකක් වෙලාවට
පිහිටට එන
යාළුවා තමයි
හොඳම
යහළුවා.

එදා මේ සිද්දිය
දැකපු කැලේ
ගොඩක් සත්තු
සමනලයයි
කුරුල්ලයි එක්ක
ගොඩක්
යාළුඋනා.

කරදර කරන හිරිහැර කරන ගෙම්බෝ වගේ
යහළුවොත් අප අතරේ ඉන්නවා.

අපි ඒ අයව තෝරාගෙන කටයුතු කරමු.

# නිමි



# පසුවදන

අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම් පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නූතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළයුතුබව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන්කිසිවකින් වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් **"හේමමාලා උපහාර"** ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබළ ගැන්වීමට ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැක්වීම ද මෙහි මූලික අරමුණයි.

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිලම තුමන් ඇතුලු ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයටද, මෙම සද්කාර්ය වෙනුවෙන් ස්තූති වන්ත වෙමු.

සෙනෙවිරත්න මහලේකම්

( ව්‍යාපෘති නිර්මාතෘ)

ISBN 978-624-211-485-9